ක්‍රීඩා ලොව

# ඔලිම්පික් ක්‍රීඩාවේ අමතර කඩුල්ල





පුරාතන ඔලිම්පික් ක්‍රීඩාව පිළිබඳ සනිටුහන් ක්‍රිස්තු පූර්ව 776 දක්වා ඈත අතීතයට දිවෙන්නකි. වසර 112 කට පෙර (1896) ග්‍රීසියේ ඇතැන්ස් නුවරින් ආරම්භ කෙරුනු නූතන ඔලිම්පික් ක්‍රීඩාව, එවකට රාජ්‍යතන්ත්‍රයේ තිබූ කාලීන අවශ්‍යතාවයක් ලෙසට වඩාත් වැඩි දක්ෂතාවයකින් සහ කායික ශක්තියකින් යුතු තැනැත්තා තෝරා ගැනීම සඳහා පැවැත්වුනි. යුගයන් ගෙවී යත්ම ලෝකය පුරා ප්‍රචලිත වෙමින්, රටවල් බොහෝ ගණනක සහභාගීත්වයෙන් යුතුව, ක්‍රීඩක-ක්‍රීඩිකාවන්ගේ සුවිශේෂ සිහිනයක් බවට එය පත්විය. ක්‍රීඩක-ක්‍රීඩිකාවන්ගේ සහජ දක්ෂතාවය, කායික ශක්තිය, නිවැරදි තාක්ෂණික පුහුණුව, නොපසුබස්නා කැපවීම සහ උත්සාහය යන මේ ඔලිම්පික් ක්‍රීඩාවේ නොකිලිටි ක්‍රීඩා ඉලක්ක පසුපස තව බොහෝ කරුණු ඈදෙන්නට පටන්ගත්තේ කාලයාගේ ඇවෑමෙනි. සියල්ල ලෝකයේ වෙළඳ අරමුණු කරා කේන්ද්‍රගත වෙමින් පවතින යුගයක, ඒ අනුව යමින් විවිධ ක්‍රීඩා ඉසව්වන්හි ඔලිම්පික් පදක්කම් උදෙසා ක්‍රීඩා-හැකියාව උත්තේජ කරන ද්‍රව්‍ය භාවිතා කිරීමට සමහර ක්‍රීඩක-ක්‍රීඩිකාවන් පෙළඹුනේ සිය සෞඛ්‍යය කෙරෙහි කිසිසේත්ම සැලකිල්ලක් නොදක්වමිනි.

ක්‍රීඩකයන් සියලු දෙනාටම සාධාරණ වූ ක්‍රීඩා වාරයක් ලබාදීම සඳහාත්, පොදු ජනතාව වෙත නොකිලිටි ක්‍රීඩා කෞශල්‍යක් ප්‍රදර්ශනය කිරීම සඳහාත්, 1963 දී මුල්වරට ඔලිම්පික් කමිටුව ඔලිම්පික් ක්‍රීඩාව සඳහා භාවිතා නොකලයුතු උත්තේජ කාරක ලැයිස්තුවක් ප්‍රසිද්ධියට පත්කරන ලදි. 1968 දී මෙක්සිකෝ නගරයේ පැවැත්වුනු 'පෙන්ටැත්ලෝන්' කණ්ඩායම් ඉසව්ව සඳහා ලෝකඩ පදක්කමක් දිනාගත් ස්වීඩන් ජාතික හැන්ස්-ගුනර් ලිල්ජින්වෙල් නැමති ක්‍රීඩකයා තරඟ කිරීම සඳහා නුසුදුසු ක්‍රීඩකයෙකුගේ තත්වයට පත්කරන ලද්දේ එමගිනි. ඔහු පදක්කම අහිමිකරගත්තේ මධ්‍යසාර භාවිතා කිරීමේ වරදට හසුවීමෙනි. තහනම් උත්තේජක භාවිතා කිරීම නිසා ඔලිම්පික් තරඟ සඳහා නුසුදුස්සන් යැයි නම් කරන ලද ලැයිස්තුව ඊළඟ ඔලිම්පික් වාරයේදී, එනම් 1972 මියුනිච් හිදී 7 දෙනෙකු වූ අතර, 2004 දී ඇතැන්ස් හි පැවති xxviii වන ඔලිම්පික් තරඟයේදී එය 26 දක්වා දීර්ඝවී තිබිනි.

ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන රාශියක එකතුවකින් යුතුව 1999 දී පැවති සම්මන්ත්‍රණයක ප්‍රතිඵලයක් ලෙසට 'ලෝක තහනම් උත්තේජක පාලන ආයතනය' බිහිවූයේ ක්‍රීඩක-ක්‍රීඩිකාවන් මෙම ක්‍රීඩා-හැකියාව උත්තේජකරන ද්‍රව්‍ය භාවිතා කිරීම වලකාලීම වෙනුවෙන්. එමගින් ඇතිකරන ලද නීති පද්ධතිය මේ වනවිට ඔලිම්පික් ක්‍රීඩාව සඳහා සියලුම රටවලට සියලුම ක්‍රීඩා ඉසව් වලට බලපැවැත්වන ආකාරයට ස්ථාපිත කර තිබේ. එය ක්‍රියාවේ යෙදෙන්නේ සාමාන්‍ය ජාත්‍යන්තර නීතියට වෙනස් වූ නීති පද්ධතියක් ලෙසටය. විවිධ උත්තේජක ගණනාවක්ම මේ වනවිටත් භාවිතා නොකල යුතු ලැයිස්තුවට ඇතුලත් කර ඇති අතර, ක්ෂේත්‍රයේ විශේෂ අත්දැකීම් ඇති විද්‍යාඥයන් එකොළොස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් මගින් වසරක් පාසා එය නැවත නැවතත් අලුත් කරනු ලබයි.

වඩාත් ප්‍රචලිතව භාවිතා වන තහනම් කරන ලද ද්‍රව්‍ය අතර ඇම්ෆිටමින්ස්, කොකේන්, සහ කැෆේන් වැනි උත්තේජක වර්ග (හදවතේ සහ හුස්ම ගැනීමේ වේගය වැඩිකිරීම මඟින් යුහුසුලු බව සහ කායික හැකියාව වැඩි කරයි), නැන්ඩ්‍රොලෝන්, සහ ඔක්සැන්ඩ්‍රොලෝන් වැනි ස්ටෙරොයිඩ (පටක වර්ධනය සඳහා වැදගත්වේ), ඩියුරටීස්, එනම් මුත්‍රා වර්ධක (වකුගඩු වලින් ජලය නැවත අවශෝෂණය කිරීම වලකයි - එමගින් ශරීරයේ බර අඩුකර ශරීර ශක්තියත් බරත් අතර ඇති අනුපාතය අඩුකරයි, බර අනුව වර්ග කරන ක්‍රීඩා ඉසව් සඳහා එය වැදගත් වේ) සහ එරිත්රොප්‍රෝටීන (ඊපීඕ) වැනි හෝමෝන වර්ග (රතු රුධිර සෛල වැඩි කිරීම මඟින් රුධිරයේ පවතින ඔක්සිජන් ප්‍රමාණය වැඩිකරයි - දිගු දුර ධාවකයන් සඳහා වැදගත්ය) වැනි ද්‍රව්‍ය විශේෂය.

ක්‍රීඩක-ක්‍රීඩිකාවන්ගේ මුත්‍රා සාම්පල මෙම උත්තේජක භාවිතා කරන්නන් හඳුනා ගැනීම සඳහා පරීක්ෂාවේ යොදවන අතර එම පරීක්ෂා සඳහා සාම්පල ලබාදීමට කලින් දැනුම් දීමකින් තොරව, ඔලිම්පික් පැවැත්වෙන කාලය තුල ඕනෑම අවස්ථාවක කිරීමට කීඩකයන් බැඳී සිටියි. සාමාන්‍යයෙන් අවසාන ඉසව්වේ 1 සිට 4 දක්වා ස්ථාන දිනාගත්තවුන් සහ අහඹු ලෙසටත්, ඊට පෙර වටයන් වලදී අහඹු ලෙසටත් ඕනෑම ක්‍රීඩකයෙක් හෝ ක්‍රීඩිකාවකගෙන් සාම්පල පරීක්ෂාවට ලක්කිරීමට ඉඩ ඇත. ඒ සඳහා චීන රජය ඩොලර් මිලියන 10ක වැයකිරීමෙන් අලුත් පර්යේෂණාගාරයක් ඉදිකර ඇති අතර, මෙවර ඔලිම්පික් වෙනුවෙන් මුත්‍රා සාම්පල 4500ක් පරීක්ෂා කෙරේ යැයි ගණන් බලා ඇත. එය 2000 සිඩ්නි වලදී පරීක්ෂා කරන ලද ප්‍රමානයෙන් 50% ක වැඩිවීමකි. මුත්‍රා පරීක්ෂාව මගින් සොයන්නේ, මෙවැනි තහනම් ද්‍රව්‍යයන් ශරීරයේ පටක තුලදී පරිවෘත්තීය ක්‍රියාවට භාජනයවූ පසුව නිෂ්පාදනය වී මුත්‍රා මගින් පිටකරන පරිවෘත්තීය අප-ද්‍රව්‍යයන්ය. මුත්‍රා වෙනුවට රුධිර පරීක්ෂාවක් නොකරන්නේ මුත්‍රා අවශ්‍ය ප්‍රමාණයක් ලබාගැනීමට ඇති පහසුවත්, එය ක්‍රීඩකයාට ශාරීරික අපහසුවක් ඇති නොකිරීමත්, විශේෂයෙන්ම පරිවෘත්තීය ද්‍රව්‍ය රුධිරයට වඩා වැඩි ප්‍රමාණයක් මුත්‍රා වල අඩංගුවීමත් නිසාය. මුත්‍රා සාම්පල ලබා ගැනීමේදී එහි පරිමාව, පී එච් අගය, සහ විශිෂ්ඨ ගුරුත්වය (මෙයින් මුත්‍රා තනුක කර ඇති දැයි සොයයි) යන කරුනු මුලින්ම සැලකිල්ලට ගනු ලැබේ.

ස්ටෙරොයිඩ පිරිමි ලිංගික හෝමෝන වලත්, ඊපීඕ වකුගඩු වලත් ස්වභාවිකව අඩංගු වන බැවින් ඒ සඳහා මුත්‍රාවල තිබී හඳුනා ගතයුතු ප්‍රමාණය සඳහා සීමා පනවා ඇත. එසේ නමුත්, ඒ නිසාම සමහරවිට වැරදි බවට පත්වූ ක්‍රීඩකයන් තම නිවැරදි භාවය සඳහා විවිධ තර්ක තම ක්‍රීඩා සංවිධානය හරහා ඉදිරිපත් කරමින් වෙනත් ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ වලදී නිවැරදි වූ අවස්ථාද ඇත.

වසර 2000 දී සිඩ්නි නුවර පැවැත්වූ ඔලිම්පික් තරඟයේදී මීටර් 200 කාන්තා ධාවන ශූරතාවය (රන් පදක්කම) හිමිකරගත් ඇමරිකාවේ මාරියන් ජෝන් ක්‍රීඩිකාව ඔලිම්පික් තරඟ අතරතුරේදී වැරදිකාරියක් ලෙසට හඳුනා නොගැනුනේ, පර්යේෂණාගාර දෙකක් මගින් පරීක්ෂා කෙරුනු ඇගේ මුත්‍රා සාම්පල එක පර්යේෂණාගාරයකින් පමණක් හඳුනා ගැනීමත් අනිත් පර්යේෂණයේ ප්‍රතිඵල එසේ නොකිරීමත් නිසාය. පසු කලෙක ඇය ඔලිම්පික් තරඟයේදී ස්ටෙරොයිඩ භාවිතා කිරීමේ වරදට වරදකාරිය වූයේ වෙනත් ආකාරයකට වරද හෙලිදරව් වීමෙනි. එම වරද කල්තබා හඳුනා ගත්තේ නම් ලෝකඩ පදක්කම දිනාගත් සුසන්තිකා ජයසිංහ තරඟය නිමකරන්නේ ශ්‍රී ලංකාවට රිදී පදක්කම හිමිකර දෙමිනි.

මීට පෙර තරඟ වලදී නිවැරදි වූ සාම්පල දින 30 ක්ද, සැක සහිත මුත්‍රා සාම්පල දින 90 ක්ද රඳවා ගන්නා ලදි. කෙසේ නමුත් මෙවර බීජිං ඔලිම්පික් තරඟ සංවිධායකයන් තීරණය කර ඇති පරිදි එහිදී ලබාගන්නා සාම්පල වසර අටක් දක්වා කාලයක් අධිශීතකරණ තත්ව යටතේ තබාගන්නේ අනාගතයේදී හඳුනා ගැනෙන වඩාත් දියුණු කරන ලද පර්යේෂණ මගින් තවදුරටත් පරීක්ෂා කිරීමේ බලාපොරොත්තුවෙනි. එය නීත්‍යානුකූලව ක්‍රීඩාවේ යෙදෙන්නන්ට මෙන්ම තරඟ නරඹන්නන්ටද එකඟවියහැකි පණිවිඩයක් වනවා ඇත.

ආචාර්ය විද්‍යානි මනතුංග

